# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2467/03 - 2025 දෙසැම්බර් මස 15 වැනි සඳුදා - 2025.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 09 වන වගන්තිය පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනවල සඳහන් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත් කරමි.

2025 මාර්තු මස 24 වැනි දිනැති අංක 2429/02 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනය මෙයින් අවලංගු කරමි.

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින.

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය

*I වන උපලේඛනය*

සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය

| | *සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය* | *ගෙවනු ලබන කාල සීමාව* | *සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව ** | *පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) *** |
|---|---|---|---|---|
| I. | අවධානමට ලක්වූ | 2026 ජනවාරි මස සිට 2026 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 480,000 | 5,000 |

| | *සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය* | *ගෙවනු ලබන කාල සීමාව* | *සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව ** | *පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) *** |
|---|---|---|---|---|
| II. | දුප්පත් | 2026 ජනවාරි මස සිට 2027 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 960,000 | 10,000 |
| III. | අන්ත දිළිඳු | 2026 ජනවාරි මස සිට 2027 ජූනි මස දක්වා එකී මාස දෙකද ඇතුළත්ව | 480,000 | 17,500 |

* *සටහන* - මෙම සංඛ්‍යාත්මක අගයන් ප්‍රතිලාභී පවුල් ගණනය කිරීම් අනුව සුළු වෙනස්කමකට ලක්විය හැක.

** *සටහන* - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ 02 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභීන් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතුය.

*II වන උපලේඛනය*

ආබාධ සහිත තැනැත්තන්, හඳුනානොගත් වකුගඩු රෝගීන්, වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා ගෙවීම්

| | *සුබසාධක ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩය* | *ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබනු ඇතැයි අපේක්ෂිත තැනැත්තන් සංඛ්‍යාව* | *මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.)* |
|---|---|---|---|
| (i) | ආබාධ සහිත තැනැත්තන් | 200,000 | 10,000 |
| (ii) | වකුගඩු ආධාර ලබන තැනැත්තන් | 70,000 | 10,000 |
| (iii) | වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් | 1,000,000 | 5,000 |

*සටහන* :- **(i) II වන උපලේඛනයෙහි සඳහන් ගෙවීම් 2026 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ගෙවිය යුතුය. කෙසේ වෙතත් 2025 මාර්තු මස 24 වැනි දිනැති අංක 2429/02 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* I වන උපලේඛනයෙහි සඳහන්ව ඇති සංක්‍රාන්තික කාණ්ඩය යටතේ එම දීමනා ලැබූ පවුල් වල ප්‍රතිලාභීන් මෙම *ගැසට් පත්‍රය* යටතේ එකී දීමනා නොලබන්නේ වුවද, II වන උපලේඛනයෙහි සඳහන් දීමනා ලැබීමට හිමිකම් ලබයි. සුබසාධක ප්‍රතිලාභ ලේඛනය තුළින් හඳුනාගනු ලැබූ ප්‍රතිලාභීන් සඳහා එකී ක්‍රමවේදය හරහාම මෙම ප්‍රතිලාභ ගෙවීමද සිදු කරනු ලැබිය යුතුය.**

(ii) තවද, II වන උපලේඛනයට අයත් ගෙවීම් සිදු කිරීමේදී සමාජ සුභසාධන ප්‍රතිලාභ රෙජිස්ටරයේ ලියාපදිංචි නොවූවද, ආබාධිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ හා වැඩිහිටි තැනැත්තන් සඳහා වන මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී දැනට ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ද එකී දීමනාව මෙම සුභසාධක ප්‍රතිලාභ ක්‍රමය හරහා ලැබීමට හිමිකම් ලබයි.

EOG 12 - 0122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.